# 15. පඬිවරුන් අතර සිටි ජේසු කුමරු

සෑම අවුරුද්දක ම පාස්කු උලෙළ සඳහා ජේසු කුමරුගේ දෙමවුපියෝ ජෙරුසලමට ගියා. ජේසු කුමරුට අවුරුදු දොළහක් වූ කල එතුමා ද දෙමාපියන් සමඟ ජෙරුසලමට ගියා. උත්සවය අවසානයේ ආපසු ගමන් ආරම්භ කළා. එහෙත් ජේසු කුමරු දෙව්මැඳුරේ රැඳී සිටියා. දෙමාපියෝ මේ වග දන්නේ නැහැ. ජේසු කුමරු තමන් අතර නැති බව දැන ගත්තාම නෑ මිතුරන් අතර ජේසු කුමරුව සෙව්වා. හමු වුයේ නැහැ. දෙමාපියන්ට බය හිතුණා. ඒ නිසා ආපසු ජෙරුසලමට ගොස් නගරය පුරා ම පුතා හෙව්වා. දෙමාපියන්ට හරියට දුක හිතුණා.

දින තුනකට පසු දේව මාලිගයේ දී ම ජේසු කුමරා හමු වුණා. එහි පඬිවරුනට සවන් දෙමින් ද ප්‍රශ්න අසමින් ද ජේසු කුමරු සිටියා. පඬිවරු ජේසු කුමරුගේ දැනුම ගැන පුදුමයට පත් වුණා. මේ දරුවා කවදා හෝ ඉතා උතුම් කෙනෙක් වන බව ඔවුන් සිතුවා.



මරියතුමිය හා ජුසේතුමාට පුදුම හිතුණා. මරියතුමිය මේ සියලු ම දේ මතකයේ තබා ගත්තා. ජේසු කුමරු ආරක්ෂා කර දෙන ලෙස දෙවි පියාට යාච්ඤා කළා.

## පැවරුම්

පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. අවුරුදු පතා ජේරුසලමේ පැවැත්වුණු උත්සවය කුමක් ද?
2. ජේසුතුමා එම උත්සවයට සහභාගි වන විට වයස කොපමණ වී ද?
3. දේව මන්දිරයේ නැවතුණු ජේසුතුමා කුමක් කළේ ද?